ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර ප්‍රථම අර්ධවාර්ෂික පරීක්ෂණය - 2017 ජූලි/ අගෝස්තු

ආර්ථික විද්‍යාව

# ECON 3130.03 – අන්තර්ජාතික වෙළෙඳ න්‍යාය

- කාලය පැය තුන (03) යි.
- ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. අත් අකුරු පැහැදිලි විය යුතුය.

01. i). "ජාත්‍යන්තර වෙළෙඳාම රටවල් අතර සාර්ථකව පවත්වාගෙනයාමට වාණිජවාදී මතවාද ඉවහල් විය" මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න.

(ලකුණු 04)

ii). නිරපේක්ෂ වාසි න්‍යායට වඩා සාපේක්ෂ වාසි න්‍යාය මඟින් රටවල් අතර ජාත්‍යන්තර වෙළෙඳාම සිදුවන ආකාරය තාර්කිකව පැහැදිලි කරන බව පිළිගනු ලබන්නේ ඇයි? පැහැදිලි කරන්න.

(ලකුණු 04)

iii). ශ්‍රී ලංකාව හා ඉන්දියාව යන රටවල රෙදි හා සහල් නිෂ්පාදන ඒකකයක පිරිවැය (රුපියල්වලින්) පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
|---|---|---|
| රෙදි | 1 | 4 |
| සහල් | 2 | 3 |

අ). ඉහත රටවල් දෙක ජාත්‍යන්තර වෙළෙඳාමට අදාළව වාසි හිමිකර ගන්නා ආකාරය දක්වන්න.

(ලකුණු 04)

ආ). රටවල් දෙක අතර රෙදි හා සහල් හුවමාරු අනුපාතය රෙදි මීටර් 04ට සහල් කි. ග්‍රෑම් 06ක් වන්නේ නම් එම රටවල් දෙක හුවමාරුවේ වාසි ලබාගන්නේ කෙසේද?

(ලකුණු 04)

02. i). සමාජ උපේක්ෂා වක්‍රය යනු කුමක් ද? අන්තර්ජාතික වෙළෙඳ න්‍යාය සමඟ එහි ඇති සම්බන්ධය කුමක් ද? පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ii). ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳව සම්භාව්‍ය මතවාදයට වඩා නව සම්භාව්‍ය මතවාදයෙහි ඔබ හඳුනාගනු ලබන විශේෂතා මොනවාද? විස්තර කරන්න.

(ලකුණු 09)

03. i). ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳව විවරණය කිරීමට හෙක්ෂර්-ඕලින් ආදර්ශයෙහි යොදා ගන්නා උපකල්පනවල වලංගුතාව පරීක්ෂා කරන්න.

(ලකුණු 06)

ii). රටවල් අතර ජාත්‍යන්තර වෙළෙඳාම සිදුවීමේ පදනම සාධක උරුමතාව වන බව හෙක්ෂර්-ඕලින් න්‍යායයෙහි සංකල්පීය ආකෘතිය සමඟ පෙන්වා දෙන්න.

(ලකුණු 06)

iii). "හෙක්ෂර්-ඕලින් නයාය ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳව වඩාත් ප්‍රායෝගික කරුණු දක්වනු ලබයි" මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද?

(ලකුණු 04)

04. i). "වැඩෙන පරිමාණානුකූල ඵල යටතේ මිල අනුපාතයේ වෙනසක් නොමැතිව වුවත් ජාත්‍යන්තර වෙළෙඳාම මඟින් රටවලට සමාජ සුබසාධනය ඉහළ නංවාගත හැකි ය" මෙම ප්‍රකාශය රූප සටහන් භාවිතයෙන් විවරණය කරන්න.

(ලකුණු 10)

ii). අන්තඃ-කර්මාන්ත වෙළෙඳාම *(intra-industry trade)* යනු කුමක් ද? ඒ සඳහා බලපාන හේතු කවරේද? එහි තරම මනිනු ලබන්නේ කෙසේද?

(ලකුණු 06)

05. i). ජාත්‍යන්තර වෙළෙඳාම හේතුවෙන් රටවල් අතර තාක්ෂණික පරතරය අවම වන ආකාරය රූප සටහන් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ii). "රටක වෙළෙඳ ශේෂයට යහපත් බලපෑමක් කරනු ලබන්නේ ආනයන මුල්කරගත් තාක්ෂණික වර්ධනයක් මඟිනි" මෙම ප්‍රකාශයෙහි වලංගුතාව පරීක්ෂා කරන්න.

(ලකුණු 09)

06. i). දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමට රජය ආනයන තීරුබදු පැනවීමක් කළ ද ඉන් ශුද්ධ වශයෙන් සමාජයට අවාසියක් සිදුවන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ii). ප්‍රාග්ධන අතිරික්තයක් හිමි රටක තීරු බද්දක් මගින් ශ්‍රමිකයින් ලබන වාසිය ප්‍රාග්ධන හිමියන් ලබන අවාසියට වඩා අඩුවීමෙන් රටේ සමස්ත සුබසාධනය පහළ යා හැකි ආකාරය සුදුසු න්‍යායයක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 09)

07. i). ආනයන තීරු බදු හා ආනයන සලාක අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii). ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තියක් වශයෙන් අපනයන සහනාධාරයක සාර්ථක අසාර්ථක බව ඔබ හඳුනාගනු ලබන්නේ කෙසේද?

(ලකුණු 05)

iii). ප්‍රපාතනය යන්න හඳුන්වා දේශීය කර්මාන්ත රැකගැනීම සඳහා ප්‍රපාතනයට එරෙහි තීරු බදු යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

***********